**හරිත විදුලි බලය සංවර්ධනය හා බල ශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජනය කිරීමේ වැඩ සටහන ( ව්‍යාපෘතිය - 1 ) - 2014**

---

හරිත විදුලි බලය සංවර්ධනය හා බල ශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජනය කිරීමේ වැඩ සටහනේ ( ව්‍යාපෘතිය - 1 ) 2014 නොවැම්බර් 20 සිට 2014 දෙසැම්බර් 31 දක්වා පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ආසියානු සංවර්ධන බැංකුව හා ලංකා විදුලි බල මණ්ඩලය අතර 2014 නොවැම්බර් 20 දින එළඹි අංක එස්ආර්අයි 47037 දරන ව්‍යාපෘති ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09(අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

වැඩ සටහනේ පහසුකම් පරිපාලන අත් පොත අනුව, විදුලි බල හා පුනර්ජනනීය බල ශක්ති අමාත්‍යාංශය වැඩ සටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ලංකා විදුලි බල මණ්ඩලය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩ සටහනේ අරමුණ වන්නේ, පිරිසිදු විදුලි බලය උත්පාදනය, පද්ධති කාර්යක්ෂමතාවය හා විශ්වාසනීයත්වය ඉහළ නැංවීමයි. පුනර්ජනනීය බල ශක්තිය උත්පාදනය, සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, ජාල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම හා ඉල්ලුම් කළමනාකරණය තහවුරු කර ගැනීම වැඩ සටහනෙන් ඉලක්ක කෙරේ. වැඩ සටහනේ පහසුකම් පරිපාලන අත්පොත අනුව, වැඩ සටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය, ව්‍යාපෘතිය - 01 යටතේ රු.මිලියන 28,509.80 කට සමාන එජඩො මිලියන 220 ක් වන අතර ඉන් රු.මිලියන 23,325.50 කට සමාන එජඩො මිලියන 180.0 ක් මූල්‍යයනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ව්‍යාපෘති - 01 කාර්යයන් 2014 නොවැම්බර් 20 දින ආරම්භ කරන ලද අතර 2019 සැප්තැම්බර් 30 වන විට නිම කිරීමට නියමිතය. මූල්‍යයන ප්‍රභවයන් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| **ප්‍රභවය** | **එජඩො මිලියන** | **රු.මිලියන** |
|---|---|---|
| **ආසියානු සංවර්ධන බැංකුව :** | | |
| සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් ණය | 121.00 | 15,680.40 |
| **ආසියානු සංවර්ධන අරමුදල් :** | | |
| - ණය | 29.00 | 3,758.10 |
| **ප්‍රංශයිස් සංවර්ධන නියෝජිතායතනය :** | | |
| - ණය | 30.00 | 3,887.00 |
| ශ්‍රී ලංකා රජය | 40.00 | 5,184.30 |
| | 220.00 | 28,509.80 |

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීමයි.

## 1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩසටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උපදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, වැඩසටහන කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් හා ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද වැඩසටහනේ වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ව්‍යාපෘති ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ වැඩසටහනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) ව්‍යාපෘති ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.1 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ව්‍යාපෘති ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඈ) ව්‍යාපෘති ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

යෝජිත මොරගොල්ල ජල විදුලි බල පිරියත ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් තැන්පත් කිරීම සඳහා උඩ පළාත හා ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ප්‍රේෂණය කරන ලද රු.මිලියන 6.12 ක මුදලක් තැන්පතු ලෙස ගිණුම්ගත කරනු වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

#### 2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------

2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/2 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛය අනුව, වැඩ සටහනේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2016 සැප්තැම්බර් 22 දිනදීය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

--------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

----------------------

මූල්‍යායනය, සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ 2014 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ව්‍යාපෘති ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් 2014 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|
| --------- | ---------------- | | ---------------------- | ------------------------ | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආසබැ | 180.00 | 23,326.20 | 2,000.00 | - | - |
| ශ්‍රීලංර | 40.00 | 5,183.60 | 750.00 | - | - |
| ලංකා විදුලිබල මණ්ඩලය | - | - | 365.00 | 0.21 | 27.00 |
| | ------- | --------- | --------- | -------- | ---------- |
| | 220.00 | 28,509.80 | 3,115.00 | 0.21 | 27.00 |

**3.2 භෞතික ප්‍රගතිය**

**-----------------**

වැඩ සටහනේ ප්‍රධාන කාර්යයන් පිළිබඳ මූලික වැඩ ලංකා විදුලි බල මණ්ඩලයෙන් සපයන ලද අරමුදල් යොදා ගෙන ආරම්භ කර තිබූ අතර, සමාලෝචිත කාල පරිච්ඡේදය අවසානයට කිසිඳු සැලකිය යුතු භෞතික ප්‍රගතියක් වාර්තා වී නොතිබුණි.

**3.3 මූල්‍ය පාලනය පිළිබඳ ගැටලු**

**-------------------------------**

විදේශ මූල්‍යයන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂිත අංශයක් පිහිටුවා තිබුණද, මෙම වැඩ සටහනේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ සෘජු වගකීම ලංකා විදුලි බල මණ්ඩලයේ අංශ 3 කට පවරා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස වැඩ සටහනේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ මූල්‍ය හා භෞතික පාලනයන් ගැටලු සහගත හා දුෂ්කර වී තිබුණි.